# ප්‍රතිමෝදන කටයුතු සඳහා කාන්තාවන් ගේ දායකත්වය

මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ගැඹුරින් සාකච්ඡාවට බඳුන් කරන කාලවකවානුවක් තුළ බොහෝ පාර්ශ්වයන් ගේ අවධානය නොලත් එහෙත් අවධානයට පාත්‍ර විය යුතු අංශයක් ලෙස ප්‍රතිමෝදන කටයුතු සඳහා වන කාන්තාවන් ගේ දායකත්වය සැලකිය හැකි ය. කාන්තාවන් ගේ දායකත්වය විමර්ශනය කිරීමට පළමු ප්‍රතිමෝදනය යනු කුමක්දැයි විමසා බැලීම වටී. භූගෝල විද්‍යා ක්ෂේත්‍රයක් ලෙස ප්‍රතිමෝදන භූගෝල විද්‍යාව හැඳින්විය හැකි ය. 'ප්‍රතිමෝදනය' යනු භාවිතය බොහෝ දෙනා හට සමීප හැඳින්වීමක් නොවුණ ද සරල ව්‍යවහාරයෙන් විනෝදනය හෙවත් විනෝද ක්‍රියා ලෙස හැඳින් වූ කල එය මිනිස් ජීවිතය හා තදින් බැඳී පවතින්නක් බව ඔබට පසක් වනු ඇත.

යම් කිසි පුද්ගලයකු ගේ මනස හා ශරීරය උත්තේජනය කරන්නා වූ ක්‍රියාවක් ලෙස ඉතා සරල ව මෙය අර්ථ දැක්විය හැකි ය. ඒකාකාරී ජීවන රටාවෙන් මිදීම උදෙසා ලද ඕනෑම අවස්ථාවක විවිධාකාරයේ ප්‍රතිමෝදන ක්‍රියාවන් සඳහා යොමුවීම වර්තමානයේ බොහෝ විට සිදුවන්නකි. පොත් කියවීම, ගීත ගායනය, ගීතවලට සවන්දීම, රූපවාහිනිය නැරඹීම, ඇඳුම් නිර්මාණය කිරීම වැනි ප්‍රාථමික ක්‍රියාවන් ගේ සිට පිහිනීම, ක්‍රීඩා කටයුතුවල නිරත වීම, කඳු නැගීම, විවිධාකාරයේ ත්‍රාසජනක ක්‍රියාවල නියැලීම වැනි කය වෙහෙසා සිදු කරන ක්‍රියාවන් දක්වා විවිධාකාරයේ විනෝදජනක කටයුතු සමාජය තුළ නිරීක්ෂණය කළ හැකි ය. ඔබ දන්නවා ද? යමෙකු ඒකාකාරී ලෙස සිය මනස වෙහෙසීමෙන් අනතුරුව ලද සුළු විවේකයේදී හෝ ලබා ගන්නා කෙටි නින්ද වුව එම තැනැත්තා ගේ මනස මෙන්ම සිරුරට ද ලබා දෙන්නේ විශාල උත්තේජනයකි.

කෙසේ වුවත් ගෝලීය වශයෙන් ගත් කල යට කී ප්‍රතිමෝදන ක්‍රියාවන් සඳහා ස්ත්‍රීන් ගේ දායකත්වය පුරුෂ පාර්ශ්වයේ දායකත්වයට සාපේක්ෂ ව අඩු අගයක් ගනී.

ලොව පිළිගත් ප්‍රතිමෝදන භූගෝල විද්‍යාඥයකු වන පැට්මෝර් (1983) අනුව ප්‍රතිමෝදනය සඳහා ලොව බල පවත්නා ප්‍රධාන අවහිරතා පහෙන් එකක් ලෙස මෙය හැඳින්වීම උගහට ය.

ලෝකය අතැඹුලක් සේ ගත් කළ එහි ජීවය පරිසරය හා එක්කර එය සුන්දර කරනුයේ ගැහැනියයි. එවන් ගැහැනියකට ලෝකයේ හිමි විය යුතු තැන නො ලැබී යාම අතීතයේ පමණක් නොව වර්තමානයේ ද අපට අසන්නට දකින්නට ලැබෙන පුවතකි. සමස්ත ලෝකය දෙස බැලූ කළ බටහිර ලෝකයේ රටවලට සාපේක්ෂ ව ආසියාතික, මැද පෙරදිග හා අප්‍රිකානු රටවල ප්‍රතිමෝදන කටයුතු සඳහා කාන්තාවන් ගේ දායකත්වය ඉතා අඩු මට්ටමක පවතිනු දක්නට ඇත. කාන්තාවන් හා බැඳී පවත්නා ඇතැම් සම්බාධකවල පවුරු පදනම් බිඳ දමා සුපුරුදු රාමුවෙන් ඔබ්බට යෑමට බොහෝ රටවල කාන්තාවන් මැලි බවක් දක්වයි.

බ්‍රාහ්මණ සමාජයේ වුව ද කාන්තාවන්ට හිමි නිදහස සීමා කිරීම බහුල ව සිදුවූවකි. පුරුෂ ආධිපත්‍යය රජයන සමාජයක කාන්තාව ජීවත් විය යුතු වූයේ කුඩා කල සිය පියා හා සහෝදරයන් ද, විවාහ වූ කල සැමියාට ද යටත් ව ය. එබැවින් කාන්තාව අවට ලෝකයෙන්

වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ මේ තත්ත්වය එතරම් සුලභ නැතත් ඉන්දියාව, ඇෆ්ගනිස්ථානය හා මැදපෙරදිග රටවල කාන්තා නිදහස සීමා කිරීම දුර්ලභ සිදුවීම් නො වේ.

ප්‍රතිමෝදන කටයුතු සඳහා කාන්තාව යොමු නොවීමට බලපාන ප්‍රධාන සාධකයක් වන්නේ කාලය හා බැඳී ඇති අවහිරතා ය. බිරිඳක සහ මවක ලෙස සමාජය තුළ සිය ප්‍රතිරූපය ගොඩ නඟා ගන්නා කාන්තාවන් ගේ මූලික අභිප්‍රාය වනුයේ සිය පවුලේ උදවිය සතුටු වන අයුරින්, ගෘහ කටයුතු ඉතා මැනවින් සිදුකිරීමයි. එහිදී විනෝද කටයුතු සඳහා මිඩංගු කිරීමට කාලය සොයා ගැනීම ඔවුන්ට ඇති ප්‍රධානම ගැටලුවයි. විශේෂයෙන් අතදරුවන් සිටින මව්වරුන් මෙවැනි අවස්ථාවල සිය අවධානය යොමු කරන අවස්ථා ඉතා විරල ය.

වෘත්තීමය කටයුතුවල නියැළෙන කාන්තාවන් ගේ තත්ත්වය ගෘහණියන් ගේ තත්ත්වයටත් වඩා දුෂ්කර වනුයේ රැකියාවට අමතර ව විවේකය හා විනෝදය සඳහා අවස්ථාවක් ලබා ගැනීමට අපහසු බැවිනි. විශේෂයෙන් ම දිවා රාත්‍රී සේවයන්හි නියැලෙන්නියක් සිය වෘත්තීමය වගකීම් හා සැලසුම් කරගත් කටයුතුවලින් මිදී ප්‍රතිමෝදන ක්‍රියාවන්හි නිරත වීම ඉතා විරළව සිදුවන්නකි.

ආගමික හා සංස්කෘතික බැඳීම් අතින් ගත් කළ වුවද ස්ත්‍රීන්ට හිමි පොදු නිදහස සීමාවනු දැකිය හැකි ය. විශේෂයෙන් ම අරාබි රටවල නොයෙකුත් ආගමික විශ්වාසයන් හේතු කොටගෙන කාන්තාව ඇඳුම් පැළඳුමින්, හැසිරීම්වලින් පමණක් නොව සිතට ප්‍රතිමෝදනය ලබා දෙන ශරීරය ඉහිල් කරන්නා වූ ක්‍රියාවන් ගෙන් පවා කාන්තාව ඈත්කර තිබෙනු දැකීම කම්පාවට කරුණකි. මේ හේතුව නිසාම වර්තමානයේ කාන්තා විමුක්තිය කාන්තා නිදහස සම්බන්ධ නොයෙකුත් කතිකාවන් එම සමාජයේ වෙසෙන කාන්තාවන් තුළින් ම පැන නැඟීම අනාගතයේ සිදුවිය හැකි මොනයම් හෝ වෙනසකට මඟ පාදනු ඇත.

බටහිර රටවල ප්‍රතිමෝදන කටයුතුවල නිරත වන කාන්තාවන් ගේ ප්‍රමාණය අනෙකුත් රටවලට සාපේක්ෂ ව වැඩි වුවද එම ප්‍රමාණයන් ගේ ද යම් යම් කුසලතා දක්නට ලැබීම විශේෂත්වයකි. සංඛ්‍යාත්මක ලෙස ගත් කළ ප්‍රතිමෝදන ක්‍රියාවන්හි නිරත වන කාන්තාවන් සියයකට පුරුෂයන් ගේ සංඛ්‍යාව පිළිවෙළින් එංගලන්තයේ 188ක් ද, ස්පාඤ්ඤයේ 176ක් ද, ප්‍රංශයේ 159ක් ද, බෙල්ජියම හා නෝර්වේ 107ක් ද, නෙදර්ලන්තය 116ක් ද, බටහිර ජර්මනිය 111ක් ලෙස දැක්විය හැකි ය. මේ අනුව ලොව ඕනෑම ස්ථානයක, ඕනෑම අවස්ථාවක කාන්තාවකට විනෝදය සඳහා ඇති ඉඩකඩ සීමාසහිත වන බව පෙනේ.

මෙවැනි විචාරාත්මක මෙන් ම ගැඹුරු පැතිකඩක් එක් ලිපියකට සීමා කිරීම අපහසු වුව ද මේ සම්බන්ධ ව ගැඹුරින් හදාරන්නකුට විමර්ශන කටයුත්තක් ලෙස පුළුල් ව මෙය විශ්ලේෂණය කළ හැකි ය. අවසන් වශයෙන් ප්‍රතිමෝදනය හෙවත් විනෝදායනය යන්න පුරුෂයන්ට පමණක් නො ව කාන්තාවන්ට ද එක සේ විඳිය යුතු විඳිය හැකි යුගයේ අවශ්‍යතාවක් ලෙස හඳුනා ගැනීම උගහට ය. ■

**කේ. බී. පී. සී. අනුරාධා විජේරත්න**